**2025-04-07 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹුණු තීරණ**

**01. දකුණු ආසියානු ගුරු සංවර්ධන මධ්‍යස්ථානය, යුනෙස්කෝ් දකුණු ආසියාතික කලාපීය කාර්යාලය සහ ඉන්දිරා ගාන්ධි ජාතික විවෘත විශ්වවිද්‍යාලය අතර ත්‍රෛපාර්ශ්වික අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම**

දකුණු ආසියානු ගුරු සංවර්ධන මධ්‍යස්ථානය ස්වාධීන සහ ස්වයංමූල්‍යන ආයතනයක් ලෙස පිහිටුවා තිබේ. එම මධ්‍යස්ථානය මඟින් ඉටු කළ යුතු කාර්යයන් යාවත්කාලීන කිරීම සඳහා එහි කාර්යයන් ප්‍රවර්ධනය කිරීම සහ කලාපයේ අනෙකුත් ආයතන හා සංවිධාන සමඟ හවුල්කාරිත්වයන් ස්ථාපිත කර ගැනීම යුනෙස්කෝ විධායක මණ්ඩලය විසින් නිර්දේශ කර ඇත. ඒ අනුව, ගුණාත්මකභාවයෙන් ඉහළ මාධ්‍ය සහ තොරතුරු සාක්ෂරතාව පිළිබඳ නව පුහුණු වැඩසටහනක් හඳුන්වා දීම මඟින් කලාපීය සහයෝගීතාව තවදුරටත් වර්ධනය කර ගැනීම හා 2030 තිරසර සංවර්ධනය පිළිබඳ න්‍යාය පත්‍රයේ දක්වා ඇති ඉලක්ක ඇතුළුව ජාතික සහ කලාපීය ක්‍රියාකාරී සැලසුම් ශක්තිමත් කිරීම අරමුණු කර ගනිමින්, දකුණු ආසියානු ගුරු සංවර්ධන මධ්‍යස්ථානය, යුනෙස්කෝ දකුණු ආසියානු කලාපීය කාර්යාලය සහ ඉන්දිරා ගාන්ධි ජාතික විවෘත විශ්වවිද්‍යාලය අතර ත්‍රෛපාර්ශ්වික ගිවිසුමක් අත්සන් කිරීමට යෝජනා වී තිබේ. යෝජිත කෙටුම්පත් අවබෝධතා ගිවිසුම සඳහා නීතිපතිගේ නිෂ්කාශනය ලැබී ඇත. එකී ත්‍රෛපාර්ශ්වික අවබෝධතා ගිවිසුමට අත්සන් තැබීම පිණිස අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය වශයෙන් ගරු අග්‍රාමාත්‍යතුමිය ඉදිරිපත් කළ යෝජනාව සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා දෙන ලදී.

**02. මුදල් ප්‍රතිපත්ති රාමුව පිළිබඳ ගිවිසුමෙහි දක්වා ඇති උද්ධමන ඉලක්කයෙන් මතුපිට උද්ධමනය (Headline Inflation) 2024 තුන්වන සහ හතරවන කාර්තු තුළ අපගමනය වීම පිළිබඳ වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම**

2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 26(1) වගන්තිය යටතේ ගරු මුදල් අමාත්‍යවරයා සහ ශ්‍රී ලංකා මහ බැංකුව අතර 2023-10-03 දින අත්සන් තබන ලද මුදල් ප්‍රතිපත්ති රාමුව පිළිබඳ ගිවිසුමට අනුව, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කරනු ලබන කොළඹ පාරිභෝගික මිල දර්ශකය මඟින් මනිනු ලබන කාර්තුමය මතුපිට උද්ධමනය 5%ක මට්ටමක පවත්වාගෙන යාමේ වගකීම ශ්‍රී ලංකා මහ බැංකුව වෙත පැවරී ඇත. 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 26(5) වගන්තියට අනුව, එම උද්ධමන ඉලක්ක නිශ්චිත ආන්තිකයෙන් අනුක්‍රමික කාර්තු 02ක් තුළ දී සපුරා ගැනීමට ශ්‍රී ලංකා මහ



163, කිරුළපන මාවත, කොළඹ 05, ශ්‍රී ලංකාව.
163, கிருலப்பன எவனியூ, கொழும்பு 05, இலங்கை.
163, Kirulapona Avenue, Colombo 05, Sri Lanka.
දු தொ T - (+94 11) 2515759
ෆැ பெ F - (+94 11) 2514753
ඊ மி E - dg@dgi.gov.lk
www.dgi.gov.lk
www.news.lk

බැංකුව විසින් අපොහොසත් වුවහොත්, මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය විසින් ඒ පිළිබඳ වාර්තාවක් මුදල් විෂයභාර අමාත්‍යවරයා මඟින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු වේ. එසේම, එම වාර්තාව මහජනතාවට ද ලබා ගත හැකි විය යුතුය. 2024 වසරේ තුන්වන හා හතරවන කාර්තුවලදී කොළඹ පාරිභෝගික මිල දර්ශකය මත පදනම් වූ මතුපිට උද්ධමනයේ කාර්තුමය සාමාන්‍යය පිළිවෙලින් 0.8%ක් සහ -1.5%ක් ලෙස වාර්තා වී ඇති අතර, එය අනුක්‍රමික කාර්තු දෙකක් සඳහා උද්ධමන ඉලක්කයට 2%කට වඩා පහළින් පවතී. එබැවින්, ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 26(5) වගන්තිය යටතේ මුදල් විෂයභාර අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කර ඇති මතුපිට උද්ධමනය අපගමනය වීම පිළිබඳ වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීම පිණිස මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

03. **නාගරික සංවර්ධන අධිකාරියට අයත් ඉඩම් සංවර්ධනය කිරීම සඳහා ආයෝජකයින් තෝරා ගැනීම**

නාගරික සංවර්ධන අධිකාරියට අයත් ඉඩම් සංවර්ධන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම සඳහා දීර්ඝකාලීන බද්ද පදනම මත බැහැර කිරීමේදී සුදුසු ආයෝජකයින් තෝරා ගැනීම සඳහා විධිමත් ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය කළ යුතු බවට මීට පෙර අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කරනු ලැබ ඇත. ඒ අනුව, රජයේ ඉඩම් ආඥාපනතේ 6(1) වගන්තිය යටතේ නාගරික සංවර්ධන අධිකාරිය වෙත පවරනු ලැබ ඇති පහත සඳහන් ඉඩම් කොටස් නාගරික සංවර්ධන අධිකාරියෙහි සැලසුම් රෙගුලාසිවලට අනුගතව, රජයේ තක්සේරුකරුගේ තක්සේරුව මත පදනම්ව දීර්ඝකාලීන බද්ද පදනම මත බැහැර කිරීම සඳහා සුදුසු ආයෝජකයින් තෝරා ගැනීම පිණිස ප්‍රසම්පාදන ක්‍රියාවලි අනුගමනය කිරීම සඳහා නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනා අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී:

* සෙල්ලකතරගම නගර සංවර්ධන කටයුතු සඳහා අත්පත් කර ගනු ලැබූ ඉඩම් අතුරින් යෝජිත නගර සංවර්ධනයට අවශ්‍ය ඉඩම් වෙන් කිරීමෙන් පසු තවදුරටත් බැහැර කළ හැකි පිළිවෙලින් පර්චස් 42.03, පර්චස් 20.28 සහ පර්චස් 20.72ක් වූ ඉඩම් කොටස් 03ක් වසර 50ක දීර්ඝකාලීන බද්ද පදනම මත බැහැර කිරීම සඳහා.

* දෙමටගොඩ (537 වත්ත) පිහිටි ඉඩමෙන් ප්‍රමාණය අක්කර 03 - රූඩ 2 - පර්චස් 24.59 ක් වන ඉඩම් කොටස වසර 99ක දීර්ඝකාලීන බද්ද පදනම මත බැහැර කිරීම සඳහා.

04. **2025-04-15 සිට 2025-10-14 දක්වා කාලය තුළ පෙට්‍රල් 92 Unl නැව් තොග 05ක් මිල දී ගැනීම සඳහා වූ කොන්ත්‍රාත්තුව පිරිනැමීම**

2025-04-15 සිට 2025-10-14 දක්වා මාස හයක (06)ක කාලයක් සඳහා පෙට්‍රල් 92 Unl බැරල් 300,000+/-5%ක් බැගින් වූ නැව් තොග 05ක් මිල දී ගැනීම සඳහා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් ලංසු කැඳවා තිබේ. ඒ සඳහා සැපයුම්කරුවන් 07 දෙනෙකු ලංසු ඉදිරිපත් කර ඇත. ස්ථාවර තාක්ෂණික ඇගයීම් කමිටුවේ සහ අමාත්‍ය මණ්ඩලය විසින් පත් කළ විශේෂ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශ මත පදනම්ව සාරානුකූලව ප්‍රතිචාර දක්වා ඇති අවම ලංසුකරු වන සිංගප්පූරුවේ M/s Vitol Asia Pte. Ltd, වෙත එකී ප්‍රසම්පාදනය පිරිනැමීම පිණිස බලශක්ති අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

05. **ජාතික හැඳුනුම්පත් නිකුත් කිරීම සඳහා පෙර මුද්‍රිත පොලිකාබනේට් කාඩ්පත් මිල දී ගැනීම සඳහා වන ප්‍රසම්පාදන ක්‍රියාවලිය**

පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් ජාතික හැඳුනුම්පත් නිකුත් කිරීම සඳහා සුහුරු කාඩ්පත් භාවිත කිරීම 2017 වර්ෂයේදී ආරම්භ කර ඇත. ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට නියමිත ඉලෙක්ට්‍රොනික ජාතික හැඳුනුම්පත් ව්‍යාපෘතිය (e-NIC) මඟින් හඳුන්වා දී ඇති නව ක්‍රමවේදය යටතේ වයස අවුරුදු 15 සම්පූර්ණ වූ සියලු ශ්‍රී ලාංකික පුරවැසියන් සඳහා ඉලෙක්ට්‍රොනික ජාතික හැඳුනුම්පතක් නිකුත් කළ යුතු වේ. ශ්‍රී ලාංකික පුරවැසියන් නැවත ලියාපදිංචි කර නව හැඳුනුම්පතක් නිකුත් කිරීම සඳහා කාඩ්පත් මිලියන 17ක පමණ අවශ්‍යතාවක් පවතින බව හඳුනා ගනු ලැබ ඇත. ඒ අනුව, එම අවශ්‍යතාව සපුරා ගැනීම සඳහා ජාත්‍යන්තර තරඟකාරී ලංසු කැඳවීමේ ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය කරමින් පොලිකාබනේට් කාඩ්පත් මිලියන 15ක් මිල දී ගැනීම පිණිස ඩිජිටල් ආර්ථික අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

06. **රේබීස් එන්නත් (මිනිස් පරිහරණය) මිලි ලීටර 0.5/මිලිලීටර 1න් අක්‍රිය කරන ලද මාත්‍රා මිලියන 3ක් සැපයීම සඳහා වූ ප්‍රසම්පාදනය**

ජලභීතිකා රෝගය වළක්වා ගැනීම පිණිස ප්‍රතිකාර කිරීම සඳහා භාවිත කරන රේබීස් එන්නත් මිලිලීටර 0.5/ මිලිලීටර 1න් අක්‍රිය කරන ලද මාත්‍රා මිලියන 3ක් සැපයීම සඳහා වූ ප්‍රසම්පාදනය යටතේ ජාත්‍යන්තර තරඟකාරී ලංසු කැඳවා ඇත. ඒ සඳහා ලංසු 05ක් ලැබී තිබේ. ඉහළ මට්ටමේ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශය මත පදනම්ව, සාරානුකූලව ප්‍රතිචාරාත්මක අවම ලංසුකරු වන ශ්‍රී ලංකාවේ M/s Gulf

Pharma (Pvt) Ltd. (Manufacturer: M/s Chiron Behring Vaccine (Pvt) Ltd., India) වෙත අදාළ ප්‍රසම්පාදනය රුපියල් මිලියන 412.80ක මුදලකට පිරිනැමීම පිණිස සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

07. **අන්ත:ශෛරික භාවිතය සඳහා වූ හියුමන් ඉමියුනොග්ලොබින් කිපි ග්‍රෑම් 5-6 වයල් 70,000ක් සැපයීම සඳහා වන ප්‍රසම්පාදනය**

ප්‍රතිශක්ති ඌනතා සහිත රෝගීන් සඳහා ප්‍රතිකාර කිරීමට භාවිත කරනු ලබන අන්ත:ශෛරික භාවිතය සඳහා වූ හියුමන් ඉමියුනොග්ලොබින් කිපි ග්‍රෑම් 5-6 වයල් 70,000ක් සපයා ගැනීම සඳහා ජාත්‍යන්තර තරඟකාරී ලංසු කැඳවා තිබේ. ඒ සඳහා ලංසු 06ක් ලැබී ඇත. ඉහළ මට්ටමේ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශය මත පදනම්ව සාරානුකූලව ප්‍රතිචාරාත්මක අවම ලංසුකරු වූ ඉන්දියාවේ M/s Reliance Life Sciences (Pvt) Ltd. වෙත අදාළ ප්‍රසම්පාදනය ඇමෙරිකානු ඩොලර් මිලියන 6.86ක මුදලකට පිරිනැමීම පිණිස සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

08. **පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ගැසට් නිවේදන ඉදිරිපත් කිරීම**

රජයේ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති පහත සඳහන් නිවේදනය/නියමය/නියෝගය අනුමැතිය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම පිණිස මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී:

* 2025-01-31 දිනැති අංක 2421/41 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති 2018 අංක 35 දරන මුදල් පනත යටතේ මෝටර් වාහන මත සුඛෝපභෝගී බදු සීමාව සංශෝධනය කිරීම සම්බන්ධයෙන් වන නිවේදනය.

* 2025-01-31 දිනැති අංක 2421/42 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති විදුලි බලයෙන් ක්‍රියා කරන වාහන සඳහා නිෂ්පාදන බදු අනුපාතය සංශෝධනය කිරීම සම්බන්ධයෙන් 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නිකුත් කරන ලද නියමය.

* 2025-01-31 දිනැති අංක 2421/30 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති අපගමන බද්ද සඳහා ලබා දී ඇති 50%ක සහනය ක්‍රියාත්මක වන කාලය දීර්ඝ කිරීම සම්බන්ධයෙන් 2003 අංක 25 දරන මුදල් පනත යටතේ නිකුත් කරන ලද නියෝගය.

09. **නව ශාක ප්‍රභේද අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ නීති කෙටුම්පත සඳහා නව අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම**

2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනත මඟින් ප්‍රකාශන අයිතිය, කාර්මික සැලසුම්, පේටන්ට් අයිතිය, ලකුණු හා ව්‍යාපාර නාම ආදියට අදාළව නීතිමය ප්‍රතිපාදන සලසා ඇති නමුත්, ශාක ප්‍රභේදවල අයිතිවාසිකම් ආරක්ෂාව (අභිජනනය කරන්නන්ට, පර්යේෂකයන්ට හා ගොවීන්ට අදාළව) සඳහා ප්‍රතිපාදන නොපවතී. එමෙන්ම, බුද්ධිමය දේපළ පනතේ වගන්ති අනුව ශාක සහ සතුන් වෙනුවෙන් පේටන්ට් අයිතිය ලබා දිය නොහැක. එබැවින්, නව ශාක ප්‍රභේද අයිතිවාසිකම ආරක්ෂා කිරීම සඳහා නව පනතක් හඳුන්වා දීම පිණිස 2024-05-22 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, නීති කෙටුම්පත් සම්පාදක විසින් නව ශාක ප්‍රභේද අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත සකස් කිරීමේ කටයුතු නිම කිරීම පිණිස වත්මන් අමාත්‍ය මණ්ඩලයේ ප්‍රතිපත්තිමය අනුමැතිය ලබා ගත යුතු බව පෙන්වා දී ඇත. එකී පනත් කෙටුම්පත සකස් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා දීම පිණිස කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

10. **2016 අංක 3 දරන සේවකයන්ගේ ජාතික අවම වේතනය පනත සංශෝධනය කිරීම**

2025 අයවැය යෝජනා මඟින් රාජ්‍ය සේවකයන්ගේ වැටුප් වැඩි කිරීමට සමගාමීව පෞද්ගලික අංශයේ සේවකයන්ගේ ද වැටුප් ඉහළ නැංවීමට යෝජනා කර ඇත. ඒ අනුව, පහත සඳහන් පරිදි ජාතික අවම මාසික වේතනය සහ ජාතික අවම දෛනික වේතනය සංශෝධනය කිරීමටත්, ඊට අදාළ අනෙකුත් නීතිමය ක්‍රියාමාර්ග අනුගමනය කිරීමටත් කම්කරු අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී:

* 2025-04-01 දින සිට ක්‍රියාත්මක වන පරිදි රුපියල් 17,500/- සිට රුපියල් 27,000/-දක්වා රුපියල් 9,500/-කින් ජාතික අවම මාසික වේතනය ඉහළ නැංවීම.
* 2025-04-01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ජාතික අවම දෛනික වේතනය රුපියල් 700/- සිට රුපියල් 1,080/- දක්වා රුපියල් 380/-කින් ඉහළ නැංවීම.

* 2026-01-01 දින සිට ක්‍රියාත්මක වන පරිදි රුපියල් 27,000/- සිට රුපියල් 30,000/-දක්වා රුපියල් 3,000/-කින් ජාතික අවම මාසික වේතනය ඉහළ නැංවීම.

* 2026-01-01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ජාතික අවම දෛනික වේතනය රුපියල් 1,080/- සිට රුපියල් 1,200/- දක්වා රුපියල් 120/-කින් ඉහළ නැංවීම.

11. **ශ්‍රී ලංකා වරලත් මාධ්‍ය වෘත්තිකයන්ගේ ආයතනය (Chartered Institute of Media Professionals - Sri Lanka) පිහිටුවීමේ පනත් කෙටුම්පත**

වරලත් ජනමාධ්‍ය වෘත්තීයවේදීන් බිහි කිරීමේ සහ මෙරට මාධ්‍ය සමාජයේ ගුණාත්මකභාවය සහ ප්‍රමිතිය ඉහළ නැංවීම උදෙසා නිපුණතාවෙන් යුත් පිරිපුන් විද්වත් මාධ්‍ය වෘත්තීයවේදීන් පිරිසක් බිහි කිරීමේ අරමුණින් අදාළ අධ්‍යයනයන් සිදු කිරීමට අවශ්‍ය පුහුණු ආයතනයක අවශ්‍යතාව සපුරාලීම සඳහා ශ්‍රී ලංකා වරලත් මාධ්‍ය වෘත්තිකයන්ගේ ආයතනය පිහිටුවීමේ අවශ්‍යතාව හඳුනාගනු ලැබ ඇත. ඒ අනුව, එම ආයතනය පාර්ලිමේන්තුවේ සම්මත පනතක් මගින් සංස්ථාපනය කිරීමට හැකි වන පරිදි පනත් කෙටුම්පතක් සකස් කිරීම පිණිස 2022-08-15 දිනැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී තිබේ. එකී පනත් කෙටුම්පත සකස් කිරීමේ කාර්යය නිම කිරීම සඳහා වත්මන් අමාත්‍ය මණ්ඩලයේ ප්‍රතිපත්තිමය අනුමැතිය ලබා දීම පිණිස සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

12. **1999 අංක 46 දරන ප්‍රජාපාදක විශෝධන පනත සංශෝධනය කිරීම**

1999 අංක 46 දරන ප්‍රජාපාදක විශෝධන පනත සංශෝධනය කිරීම සඳහා 2024-01-24 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, නීති කෙටුම්පත් සම්පාදක විසින් සකස් කරනු ලැබ ඇති පනත් කෙටුම්පත සඳහා නීතිපති විසින් සංශෝධන යෝජනා කිහිපයක් ඉදිරිපත් කරනු ලැබ තිබේ. එකී යෝජිත සංශෝධනයන් ද ඇතුළත් කරමින් ප්‍රජාපාදක විශෝධන පනත සංශෝධනය කිරීම පිණිස අවයන් පනත් කෙටුම්පත සකස් කරන ලෙස නීති කෙටුම්පත් සම්පාදකට උපදෙස් දීම සඳහා අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 13. 1973 අංක 48 දරන ජාතික ලේඛනාරක්ෂක නීතිය සංශෝධනය කිරීම

1973 අංක 48 දරන ජාතික ලේඛනාරක්ෂක නීතිය සංශෝධනය කිරීම සඳහා යෝග්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීම පිණිස ලේඛන කළමනාකරණය, ලේඛන සංරක්ෂණය සහ අංකිත ලේඛන කළමනාකරණය යන විෂයයන් පිළිබඳ ප්‍රවීණයන්ගෙන් සමන්විත විද්වත් කමිටුවක් පත් කිරීම පිණිස 2022-11-21 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. එම විද්වත් කමිටුව විසින් මහජනතාවගේ අදහස් සහ අනෙකුත් උපදේශන සැලකිල්ලට ගෙන අධිලේඛන හා වාර්තා කළමනාකරණ ජාතික ප්‍රතිපත්තියක් කෙටුම්පත් කර ඇත. එසේම, 1973 අංක 48 දරන ජාතික ලේඛනාරක්ෂක නීතිය සහ 1981 අංක 30 දරන ජාතික ලේඛනාරක්ෂක (සංශෝධන) පනත පරිච්ඡින්න කර ජාතික අධිලේඛන සහ වාර්තා කළමනාකරණ පනත් කෙටුම්පතක් සකස් කිරීම පිණිස පදනම් කර ගැනීම සඳහා මූලික කෙටුම්පතක් ද සකස් කරනු ලැබ තිබේ. ඒ අනුව, විද්වත් කමිටුව විසින් සකස් කර ඇති අධිලේඛන සහ වාර්තා කළමනාකරණ ජාතික ප්‍රතිපත්තිය සම්මත කිරීමටත්, 1973 අංක 48 දරන ජාතික ලේඛනාරක්ෂක නීතිය සහ 1981 අංක 30 දරන ජාතික ලේඛනාරක්ෂක (සංශෝධන) පනත පරිච්ඡින්න කරමින් ජාතික අධිලේඛන සහ වාර්තා කළමනාකරණ පනත හඳුන්වා දීම සඳහා පනත් කෙටුම්පතක් සකස් කරන ලෙස නීති කෙටුම්පත් සම්පාදකට උපදෙස් දීමටත් බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 14. රාජ්‍ය සේවයේ අත්‍යවශ්‍ය පුරප්පාඩු පිරවීම සඳහා උපාධිධාරීන් සහ තරුණ තරුණියන් 30,000ක් බඳවාගැනීම

දේශපාලන බලපෑම්වලින් තොරව කුසලතා සහ සුදුසුකම් මත පමණක් පදනම්ව, රාජ්‍ය අංශය සඳහා බඳවාගැනීම් සිදු කිරීම වත්මන් රජයේ ප්‍රතිපත්තිය වේ. කොවිඩ් - 19 වසංගතය සහ මෑතකාලීන ආර්ථික හා දේශපාලන අස්ථාවරත්වය හේතුවෙන් රැකියා විරහිත උපාධිධාරීන් සහ තරුණ තරුණියන් සංඛ්‍යාව සීඝ්‍ර ලෙස ඉහළ ගොස් තිබීමත්, පවතින රාජ්‍ය මූල්‍ය අවකාශයත් සැලකිල්ලට ගනිමින් රාජ්‍ය සේවයේ අත්‍යවශ්‍ය පුරප්පාඩු 30,000ක් පිරවීම සඳහා 2025 අයවැය තුළින් රුපියල් බිලියන 10ක ප්‍රතිපාදන වෙන් කිරීම පිණිස මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද අයවැය යෝජනාවට පාර්ලිමේන්තුවේ අනුමැතිය ලැබී තිබේ. රාජ්‍ය සේවයේ විවිධ ආයතනවල කාර්යමණ්ඩල නැවත සමාලෝචනය කර, අත්‍යවශ්‍ය බඳවාගැනීම් සිදු කිරීම පිණිස නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා අග්‍රාමාත්‍ය ලේකම්ගේ ප්‍රධානත්වයෙන් නිලධාරි කමිටුවක් පත් කර ඇත. එම කමිටුව විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශ මත පදනම්ව මේ වන විට රාජ්‍ය සේවයේ නව බඳවාගැනීම් 18,853ක් සඳහා අමාත්‍ය

මණ්ඩල අනුමැතිය ලබා දී තිබේ. ඒ අනුව, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන ඇමතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාවක් සැලකිල්ලට ගෙන "2025 අයවැය මඟින් යෝජිත රැකියා විරහිත උපාධිධාරීන් සහ තරුණ තරුණියන් 30,000ක් රාජ්‍ය සේවයට බඳවාගැනීමේ වැඩපිළිවෙල" යටතේ නියමිත බඳවාගැනීම් පටිපාටිවලට අනුකූලව අයදුම්පත් කැඳවා එකී බඳවාගැනීම් සිදු කිරීම පිණිස අදාළ අමාත්‍යාංශ විසින් කඩිනමින් පියවර ගත යුතු බවට අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කරන ලදී.

15. **2024 වර්ෂය සඳහා වන ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික ආර්ථික විවරණය පිළිබඳව වන වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම**

2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 80(3) වගන්තිය අනුව සෑම මුදල් වර්ෂයක්ම අවසන් වී සිව් මසක කාලයක් තුළ එම මුදල් වර්ෂය තුළ පැවති ආර්ථික තත්ත්වය පිළිබඳ වාර්තාවක් මුදල් විෂයභාර අමාත්‍යවරයා විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතුව ඇත. ඒ අනුව, 2024 වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සකස් කරනු ලැබ ඇති ශ්‍රී ලංකා මහ බැංකුවේ ආර්ථික විවරණය පිළිබඳව වන වාර්තාව ජනාධිපතිතුමා වෙත ඉදිරිපත් කරනු ලැබ ඇත. එකී වාර්තාව මඟින් ශ්‍රී ලංකාවේ සාර්ව ආර්ථික ප්‍රවණතා, මූල්‍ය පද්ධතියෙහි තත්ත්වය හා ප්‍රධාන වර්ධනයන් සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිපත්ති පිළිබඳ සමාලෝචනයක් ඉදිරිපත් කර තිබේ. ඒ අනුව, 2024 වර්ෂය සඳහා වන ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික ආර්ථික විවරණය පිළිබඳව වන වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම පිණිස මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**********